# මිහින්තලා ලෙන්ලිපි මගින් හෙළිවන ස්ත්‍රියගේ සමාජ තත්ත්වය.

**කුමාරසේකර සී.එල්.කේ.එස්.ටී,[1] චන්ද්‍රපාල සී.ඩී.ඩී.[2]**

ශ්‍රී ලංකාවේ බුදු දහමේ කේන්ද්‍රස්ථානයක් ලෙස මිහින්තලාව හැඳින්විය හැකිය. මිහින්තලාව කේන්ද්‍ර කොටගෙන ලංකාවේ ඓතිහාසික සිදුවීම් රැසක් සිදු විය. ඒ අතර භික්ෂූන් වහන්සේලාහට ලෙන් පූජා කිරීම සුවිශේෂී වේ. එහිදී සමාජයේ විවිධ පුද්ගලයින් ලෙන් පූජා කළ අතර ඔවුන් සිය අනන්‍යතාව සන්නිවේදනය කරනු වස් විවිධ සටහන් තබන ලදි. එම සටහන් ලෙන්ලිපිය. කාල නිර්ණයට අනුව මේවා මූල බ්‍රාහ්මීය ලිපි වේ. මෙම ලෙන්ලිපි සන්නිවේදනය අරමුණු කොටගෙන කෙටුවත් එමගින් තත්කාලීන සමාජ තොරතුරු අනාවරණය වේ. එම තොරතුරු අතර කාන්තාවට හිමි වු සමාජ තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීම මෙහි අධ්‍යයන අරමුණයි. තත්කාලීන සමාජය තුළ කාන්තාව ආගමික හා සමාජ සංස්කෘතිකමය වශයෙන් කවර වරප්‍රසාද භුක්ති විඳිමින් ජීවත් වුවාද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යනයෙහි අරමුණයි. මේ සඳහා පුස්තකාල ගවේෂණය හා අන්තර්ජාලය තුළින් දත්ත රැස් කරගන්නා ලදි. තත්කාලීන සමාජය තුළ කාන්තාව ආගමික හා සමාජ සංස්කෘතිකමය වශයෙන් වරප්‍රසාද රැසක් භුක්ති විඳිමින් ජීවත් වු බව මෙහිදී උපකල්පනය කෙරේ. මිහින්තලා ලෙන්ලිපි විමර්ශනයේ දී තත්කාලීන කාන්තාව බෞද්ධාගමික කාන්තාවක් වශයෙන් නිදහස භුක්ති විඳි බව පැහැදිලි වේ. එහිදී කාන්තාව බෞද්ධාගමික වශයෙන් ලබාගත හැකි උසස්ම ඵලය වන භික්ෂුණීත්වය ලබාගත් බව මෙහෙණින් වහන්සේලා ලෙන් පූජා කිරීමට දායක වීමෙන් පැහැදිලි වේ. තවද උපාසිකාවක් වශයෙන් ලෙන් පූජා කිරීමට සේම බුදු දහම ඇදහීමට පවා නිදහසක් කාන්තාවට හිමි වූ බව පැහැදිලි වේ. මිහින්තලා ලෙන්ලිපි දෙස බලන විට රජවරුන්ගේ, ප්‍රාදේශීය රජවරුන්ගේ බිසෝවරු හා දියණිවරු මෙන්ම පරුමක, ගමික, භාණ්ඩාගාරික, අශ්වාරෝහක හා ගපති ආදී විවිධ සමාජ මට්ටම්වල කාන්තාවන් ද ලෙන් පූජා කිරීමට දායක වී ඇති බව හෙළි වේ. ඒ අනුව සමාජයේ කවර තරාතිරමක සිටි කාන්තාවකට වුවද ආගම ඇදහීමේ හා ලෙන් පූජා කිරීමේ නිදහස පැවති බව පැහැදිලි වේ. එමගින් කාන්තාව සමාජ සංස්කෘතිකමය වශයෙන් පුළුල් නිදහසක් භුක්ති විඳි බව පෙනේ. මිහින්තලය ලෙන් ලිපි දෙස විමර්ශනාත්මකව බලන විට කාන්තාව ලෙන් පූජා කිරීමට දායක වූ බව සටහන් කරන විට බොහොමයක් ලිපි තුළ පුරුෂයකුගේ හෝ පරම්පරාවක් පිළිබඳව දක්වා කාන්තාවගේ නම සඳහන් කර තිබේ. ඒ අනුව ඇය කෙතරම් සමාජ නිදහසක් භුක්ති වින්දා වුවද පුරුෂ මූලික සමාජ රටාවක් පැවති බව නිගමනය කිරීමට හැකි ය. මේ අනුව කාන්තාව ආගමික වශයෙන් හා සමාජ සංස්කෘතිමය වශයෙන් වරප්‍රසාද රැසක් භුක්ති විඳිමින් පුරුෂ මූලික සමාජ ක්‍රමයක ජීවත් වූ බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** සංස්කෘතිය, බෞද්ධාගම, සෙල්ලිපි, අභිලේඛන, කාන්තාව

---

[1,2] භාෂා අධ්‍යයන අංශය, රජරට විශ්වවිද්‍යාලය. tharukaclks@gmail.com